# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1947/23 - 2015 දෙසැම්බර් මස 30 වැනි බදාදා - 2015.12.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු නිවේදනය

රේගු ආඥාපනත (235 වන අධිකාරිය)

1988 අංක 13 දරන පනතින් සංශෝධිත රේගු ආඥා පනතේ (235 අධිකාරය) 103 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මා විසින් 2016 ජනවාරි මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි පහත සඳහන් මඟී තොරතුරු කල් තබා (විද්‍යුත්) වාර්තා කිරීමේ නියෝග නිකුත් කරමි.

රවී කරුණානායක,<br>
මුදල් අමාත්‍ය.

2015 දෙසැම්බර් මස 30 වන දින,<br>
කොළඹ 01,<br>
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**නියෝග**

1. මෙම නියෝග 2015 අංක 2 දරන මඟී තොරතුරු කල් තබා (විද්‍යුත්) වාර්තා කිරීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2016 ජනවාරි මස 01 (මෙහි මින් මතු බලපැවැත්වෙන දිනය වශයෙන් හඳුන්වනු ලබන) දින සිට බල පැවැත්වේ.

2. මෙම නියෝග වල කටයුතු සඳහා “ගුවන් යානා මෙහෙයුම්කරු” යන පාඨයට ගුවන් සමාගම් හා ගුවන් සමාගම් වල දේශීය නියෝජිතයන් මෙන්ම දේශීය කළමණාකරුවන්ද ඇතුළත් වන්නේය.

1 කොටස

**ගුවන් යානා මෙහෙයුම්කරුවන් ලියාපදිංචි කිරීම**

3. විදේශීය ගුවන් තොටක සිට ශ්‍රී ලංකාවේ ගුවන් තොටකට පැමිණෙන හා ශ්‍රී ලංකාවේ ගුවන් තොටකින් විදේශ ගුවන් තොටකට පිටත් වන ගුවන් යානා වල මෙහෙයුම් කරුවන් ගුවන් මඟී තොරතුරු විද්‍යුත් මාර්ගයෙන් වාර්තා කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ ලියාපදිංචි වියයුතු අතර එවන් මෙහෙයුම් කරුවන් අදාළ අයදුම් පත් සම්පූර්ණ කොට ශ්‍රී ලංකා රේගුවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය වෙත ඉදිරිපත්කොට මඟී තොරතුරු විද්‍යුත් මාර්ගයෙන් ඉදිරිපත් කිරීමට ලියාපදිංචි අංකය හා රහස් කේතයන් ලබාගත යුතු ය.

4. මෙම නියෝග 3 යටතේ සිදුකරන ලද ලියාපදිංචිය රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අත්හිටුවනු නොලැබුවහොත් හෝ අවලංගු නොකලහොත් ලියාපදිංචි දිනයේ සිට වසර දෙකක කාලයක් සඳහා බල පැවැත්වේ.


1A - G 22105 — 41 (2016/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

5. ශ්‍රී ලංකා රේගුවේ දැනට ලියාපදිංචි වී ඇති ගුවන් යානා මෙහෙයුම්කරුවන් මෙම රෙගුලාසි ක්‍රියාත්මක වන දිනයේ සිට වසර දෙකකට පසු ඔවුන්ගේ ලියාපදිංචිය අලුත් කල යුතු ය.

**2 කොටස**

**මගී තොරතුරු කල් තබා වාර්තා කිරීම**

6. ශ්‍රී ලංකාවෙන් පිටත ගුවන් තොටුපොලක සිට ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපොලක් වෙත පැමිණෙන ගුවන් යානාවක් හා ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපොලක සිට ශ්‍රී ලංකාවෙන් පිටත තොටුපොලක් කරා නික්ම යන ගුවන් යානාවකට මෙම කොටසේ නියෝග අදාල වන්නේය.

7. ගුවන් යානාවක් ශ්‍රී ලංකාවෙන් පිටත ගුවන් තොටුපොලක සිට ශ්‍රී ලංකාව තුළ ප්‍රථම ගුවන් තොටුපල වෙත පැමිණීමට නියමිත විටක හෝ ගුවන් යානාවක් ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපලක සිට ශ්‍රී ලංකාවෙන් පිටත ගුවන් තොටුපලක් වෙත නික්ම යාමට නියමිත විටක එකී ගුවන් යානාවේ ක්‍රියාකරු එම ගුවන් යානාව පිළිබඳව ද, ගුවන් යානාවේ සියළු කාර්යමණ්ඩල තොරතුරු හා මගීන්ගේ තොරතුරු ශ්‍රී ලංකා රේගුව වෙත විද්‍යුත් මාර්ගයෙන් වාර්තා කල යුතු ය.

මෙම නියෝගයේ කාර්යයන් සඳහා ගුවන් යානාවේ ගමන් ගන්නා පුද්ගලයන් සම්බන්ධයෙන් අවශ්‍ය වන තොරතුරු පහත පරිදි වේ.

i. පෙළපත්නාමය, මුල් නම හා මැද නමක් ඇතොත් එය
ii. උපන් දිනය
iii. ස්ත්‍රී පුරුෂ භාවය
iv. ජාතිකත්වය හා පුරවැසිභාවය
v. පුද්ගලයාගේ අනන්‍යතාවය තහවුරු කරන ගමන් ලේඛනයේ වර්ගය, එම ගමන් ලේඛනය නිකුත් කළ රට, එම ගමන් ලේඛනයේ අංකය හා එම ලේඛනය කල් ඉකුත් වන දිනය
vi. ආසන වෙන්කර ගැනීමේ වාර්තා කේතය ඇත්නම් එය හෝ යානයේ කාර්යභාර පුද්ගලයා හෝ අනෙක් ගුවන් යානා කාර්යමණ්ඩල සාමාජිකයෙකු වන විටකදී එම කාර්ය මණ්ඩල සාමාජිකයාගේ තනතුර

8. ශ්‍රී ලංකාවෙන් පිටත ගුවන් තොටුපලක සිට ශ්‍රී ලංකාව බලා එන ගුවන් යානාවක් සම්බන්ධයෙන් වන මගීන් පිළිබඳ කල් තබා තොරතුරු එම යානාව ශ්‍රී ලංකාවෙන් පිටත පිටත් වන ගුවන් තොටුපොලේ සිට නික්මීමෙන් විනාඩි 15ක් ගෙවී යාමට ප්‍රථම ශ්‍රී ලංකා රේගුවේ මගී තොරතුරු පද්ධතිය වෙත වාර්තා කළ යුතු ය.

9. ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපොලක සිට විදේශ ගුවන් තොටුපොලක් බලා නික්ම යන ගුවන් යානාවක් සම්බන්ධයෙන් වන මගීන් පිළිබඳ කල් තබා තොරතුරු ශ්‍රී ලංකා රේගුවේ මගී තොරතුරු පද්ධතිය වෙත ගුවන් යානාවේ නික්ම යාමේ අවසරය ශ්‍රී ලංකා රේගුවෙන් ලබාගැනීමට ප්‍රථම වාර්තා කළ යුතු ය.

10. නියෝග 7 හි සඳහන් මගී තොරතුරු ශ්‍රී ලංකා රේගුවේ නිල වෙබ් අඩවියේ නියම කර ඇති ''පණිවුඩ ක්‍රියාවේ යෙදවීමේ මාර්ගෝපදේශ'' හි සඳහන් ආකෘතින්ගෙන් එක් ආකෘතියකට අනුව විද්‍යුත් මාර්ගයෙන් වාර්තා කළ යුතු ය.

11. මගී තොරතුරු විද්‍යුත් මාර්ගයෙන් කල් තබා වාර්තා කිරීම සඳහා කලින් කලට වෙනත් ආකෘතීන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කල හැකි අතර, එම උපදෙස් පණිවුඩ ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශවල ප්‍රසිද්ධ කල හැක.

**3 කොටස**

**උල්ලංඝනය කිරීම්**

12. ඉහත 7,8 හෝ 9 හි සඳහන් යම් නියෝගයකින් අවශ්‍ය තොරතුරු පොදු විලම්බන කාලයේ හෝ දීර්ඝකරන ලද විලම්බන කාලයෙන් පසු නොසැපයීම, වංචනිකව වෙනස් කල හෝ අසත්‍ය තොරතුරු වාර්තා කරන ගුවන් යානා මෙහෙයුම්කරුවකු දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කරන අතර, මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ කරනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරුවීම මත රුපියල් ලක්ෂය නොඉක්මවන දණ්ඩනයකට යටත්වේ.

## 4 කොටස

### පොදු විලම්බන කාල පරිච්ඡේදය

13. පොදු විලම්බන කාල පරිච්ඡේදය නියෝගයන් ක්‍රියාත්මක වන දිනෙන් ආරම්භව මාස 03 ක කාල පරිච්ඡේදයකි.

14. (අ) පොදු විලම්බන කාල පරිච්ඡේදය අවසානයේදී ක්‍රියාත්මක වීම සඳහා තවදුරටත් දීර්ඝ කරන ලද විලම්බන කාල පරිච්ඡේදයක්, ගුවන් යානා මෙහෙයුම්කරුට ලබා දෙන ලෙසට ගුවන් යානා මෙහෙයුම්කරු විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ඉල්ලා සිටින්නේ නම්, සහ

(ආ) ගුවන් යානා මෙහෙයුම්කරු පොදු විලම්බන කාලය තුළදී

i. විද්‍යුත් මගී තොරතුරු කල්තබා වාර්තා කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ස්ථාපනය කිරීමෙන්, හෝ

ii. විද්‍යුත් මගී තොරතුරු කල්තබා වාර්තා කිරීම සඳහා ව්‍යාපාර පරිචයන් ක්‍රියාවට නංවමින් ව්‍යාපාර සැලසුම්වලට ඇතුළත්වීමෙන්, පොදු විලම්බන කාල පරිච්ඡේදය තුළ සෑහෙන ප්‍රගතියක් සලසාගෙන ඇති බවට රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමකට පත් වන්නේ නම් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ස්වකීය අභිමතය මත පොදු විලම්බන කාල පරිච්ඡේදය අවසානයේදී ආරම්භවන මාසයකට නොවැඩි වැඩිමනත් විලම්බන කාල පරිච්ඡේදයක් එම ගුවන් යානා මෙහෙයුම්කරුට ලබාදිය හැක.

## 5 කොටස

### දත්ත පෞද්ගලිකත්ව සුරක්ෂණය

15. මෙම නියෝග වලට අනුව සපයන ලද කල් තබා දැනුම් දෙන මගී තොරතුරු ඉහළ සංවේදී බවකින් යුත් හෙයින් ශ්‍රී ලංකා රේගුව, මෙම දත්තයන් ගබඩාකරණය, ප්‍රවේශය, භාවිතය හා හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් දැඩිව පාලනය කිරීමට අවශ්‍ය පියවර ගත යුතු ය.

16. මෙම දත්තයන්ට ප්‍රවේශවීම හා භාවිතය සඳහා රේගුවේ හෝ වෙනත් නීති බලාත්මක කරන නිලධාරීන්ට අවසර ලබා දීම රේගු අධ්‍යක්ෂවරයකුට නොඅඩු මට්ටමේ නිලධාරියෙකු විසින් කළ යුතු අතර එසේ අවසර ලබාදීමේ දී උපරිම සැලකිල්ලකින් යුතුව එම අවසර දීම කළ යුතු ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.